# මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය

## ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU)

## පුරප්පාඩු

**01. ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය:**

කොළඹ වරාය නගරය වූ කලී ශ්‍රී ලංකාවේ මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්කය වන කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි ආකර්ෂණීය වාණිජ නගරය වන කොළඹ නගරය දීර්ඝ කිරීමෙන් අනතුරුව ගොඩනගා සංවර්ධනය කරන ලද නවතම නගරයකි. ගොඩබිම සිට සමුද්‍රය දෙසට හෙක්ටයාර 269ක් දක්වා දිවෙන බිම් තීරයේ පිහිටි මෙම කොළඹ වරාය නගරය ඉන්දීය සාගරයේ උණුසුම් දිය දහර ආසන්නයේ අසමසම සැලසුම්ගත නාගරික ජීවන රටාවක පහසුකම් සලසා දෙමින් දකුණු ආසියාවේ ප්‍රමුඛ නේවාසික, වෙළඳ හා ව්‍යාපාරික ගමනාන්තයක් වනු ඇත.මෙම වරාය නගරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය වෙත පැවරී ඇති වගකීම් සම්බන්ධීකරණය, කළමනාකරණය, නිරීක්ෂණය සහ සුපරීක්ෂණය සඳහා අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපනය කර ඇත.

**02. පිරවීමට නියමිත පුරප්පාඩු තනතුරු:**

| අනු අංකය | තනතුර | චක්‍රලේඛ අංකය 10/2025 අනුව වැටුප් කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | රියදුරු | PL 3 – 2025 Grade III | 02 |

**03. අයදුම් පත් ඉදිරිපත් කිරීම සඳහා කොන්දේසි:**

**පොදු කොන්දේසි**

01. (i). බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

(ii). බඳවා ගැනීමේ සුදුසුකම් :

- අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට වැඩි හා 45ට අඩු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(iii). අධ්‍යාපන සුදුසුකම්:

- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල / දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක්(06)ක් සමත්වී තිබීම.

(iv). වෘත්තීය සුදුසුකම් :

- බඳවා ගන්නා දිනට වසර තුනක (03)ට පෙර අවම වශයෙන් සී සහ සී1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.

- මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

**04.වැටුප් පරිමාණය**

| | |
|---|---|
| 01.සේවා ගණය | : රියදුරු සේවය |
| 02. වැටුප් කේතය | : PL – 3- 2025 Grade III |
| 03. වැටුප් පරිමාණය | : රු.42,780 – 10x 490 – 10x 540 – 10x590 – 12x630 = රු.66,540 කි. |
| 04. ශ්‍රේණිය | : III ශ්‍රේණිය |

**05. අයදුම්පත්:**

දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/ 2026 හි 2:3:3 ඡේදයේ (ආ) අනුව අයදුම් කළ යුතු අතර, රාජ්‍ය / රාජ්‍ය නොවන ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත අදාළ ආයතනයේ ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය. රාජ්‍ය සේවයේ නොමැති අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

අපේක්ෂකයන් දුරකතන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය (තිබේ නම්) සමඟ සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු මෙහි අමුණා ඇති අයදුම්පත භාවිතා කරමින් සකස් කර **2026.04.22** දින හෝ ඊට පෙර, පහත සඳහන් විද්‍යුත් ලිපිනයට ලැබෙන පරිදි විද්‍යුත් තැපැලෙන් එවිය යුතුය.

**විද්‍යුත් තැපැල් ලිපිනය : psportcity@gmail.com**